# පට්ට පොරවල් නෝන්ඩි වෙනවා



මේ ලිපිය හෙඩිමට දාපු ලයින් එක එන්නේ පහුගිය කාලේ රාජපක්ෂ ආණ්ඩුවට සහ රාජපක්ෂලාට කඩේ ගිහින් කුපිත වුණු දක්ෂ රංගන ශිල්පියෙක් සහ අධ්‍යක්ෂකවරයෙක් වන ජැක්සන් ඇන්තනීගේ 'ඇඩ්‍රස් නැහැ' ෆිල්ම් එකට මහාචාර්ය සුනිල් ආරියරත්න ලියපු තේමා ගීතයේ 'පට්ට පොරවල් නෝන්ඩි වෙනවා' කියන්නේ මෑත කාලයේ සමාජ දේශපාලන කරලියට වගේම සංස්කෘතික ක්ෂේත්‍රයටත් හොඳටම ගලපන්න පුලුවන් මහාචාර්ය සුනිල් ආරියරත්න බස්සපු පට්ට ලයින් එකක්. මොකද මේ හැම ක්ෂේත්‍රයකම පට්ට පොරවල් එකසිය ගාණට නෝන්ඩි වෙන හැටි අපිට පේනවා.

සිනමාවට සම්බන්ධ කාරණාවක් කතා කරන්න වෙච්ච හින්දා මේ ලයින් එක සිනමාවට කොහොමද ගැළපෙන්නේ කියලා බැලුවොත් හොඳයි කියලා හිතුණා. මොකද ඒකට හේතුවක් සපයපු චිත්‍රපටයක් මේ දවස්වල තිරගත වෙනවා. අපි බොහොම බලාපොරොත්තු තියාගෙන හරඹන්න ගියපු ධර්මසේන පතිරාජ අධ්‍යක්ෂණය කරපු 'සක්කාරං' චිත්‍රපටය සුනිල් ආරියරත්නගේ අපි මුලින් කියපු ලයින් එක අපිට ආපහු සැරයක් මතක් කෙරෙව්වා. පතිරාජ අපේ රටේ සිනමාවේ පට්ට පොරක් කියන එකට විවාදයක් නැහැ. ඒත් 'සක්කාරං' හරහා පතිරාජ තමන්ගේ ඒ ප්‍රතාපවත් සිනමා ඉතිහාසය කුඩු පට්ටම් කරගන්න හදනවා. අපිට තේරුම් ගන්න බැරි සිංහල සිනමාව ගොඩදාපු පතිරාජලා සහ පතිරාජලාගේ පරම්පරාවේ අය අද මේ විදියට අව සිහියෙන් වැඩ කරන්නේ ඇයි කියලා. පතිරාජලාට පෙර පරම්පරාවේ ලෙස්ටර් පීරිස් වගේ අයත් මේ දේම කරගත්තා. මේක නම් මාර ලෙඩක් තමයි.

'සක්කාරං' චිත්‍රපටය ධර්මසේන පතිරාජගේ නමට තරම් නොවන බව අපි කියන්නේ පතිරාජගේ සිනමා ඉතිහාසය දිහා බලලා. සිංහල සිනමාවේ සැබෑ කැරළිකාරයෙක් වුණු පතිරාජගෙන් මේ හැඩයේ චිත්‍රපටයක් බොහෝ දෙනෙක් බලාපොරොත්තු නොවන්න ඇති. සමහරවිට මේ චිත්‍රපටය හරහා කරන්න හදපු දේ පතිරාජට හරියට කරගන්න බැරිවුනාද දන්නෙත් නෑ. මේ චිත්‍රපටය ජයන්ත චන්ද්‍රසිරි වගේ අධ්‍යක්ෂකවරයෙක් කළා නම් අපිට මෙහෙම වාද කරන්න ඕන වෙන එක්ක නැහැ. මොකද ඒක ගැළපෙන දෙයක්. ජයන්තගේ සිනමා හා ටෙලිනාට්‍ය ඉතිහාසයට අනුව ජයන්තට මේ වගේ දෙයක් උචිතයි. 'අහස් ගව්ව' හරහා පතිරාජ ලකුණ දැකපු මිනිස්සු 'සක්කාරං' වගේ චිත්‍රපටයකින් දකින්න අකමැති වීම පුදුමයට කරුණක් නොවෙයි. මොන තර්ක දැම්මත් අපි මේ කියන කාරණාව පතිරාජගේ හෘද සාක්ෂිය දන්නවා ඇති.

විජය කුමාරතුංග කියන වානිජ සිනමාවේ 'සුපර් හිට්' පෙම්වතාට, වීරයාට නැත්නම් කොල්ලට 'බඹරු ඇවිත්' චිත්‍රපටයෙන් ප්‍රමෝෂන් එකක් දෙන්න පුළුවන් වුනාට 'සක්කාරං' චිත්‍රපටයේදී සුබේ ගුරුන්නාසේ කියන බලන් ඉන්න අයගේ මයිල් කෙලින් වෙන සයිස් එකට නටන්න පුලුවන් කියලා පෙන්නන්න හදන චරිතය රගපාන බිමල් ජයකොඩි ලව්වා තාලම් පට ගහන එකෙන් එහාට වැඩ ගන්න පතිරාජට බැරි වීම ගැන එදා ඉඳලා පතිරාජගේ ෆිල්ම් බලපු ප්‍රේක්ෂකයන්ට දුක හිතෙන එක පුදුමයක්ද? 'අහස් ගව්ව' චිත්‍රපටයේ කලංසූරිය හෝ 'බඹරු ඇවිත්' චිත්‍රපටයේ විමල් කුමාර ද කොස්තා ලව්වා ප්‍රේක්ෂකයින්ට ජීවිතයට අමතක නොවන රගපෑම් උලුප්පලා ගත්තු



සිනමාවේ ගලිවර්ලා වගේ වැඩ කරපු අය වයසට යන්න යන්න ලිලිපුට්ලා වීම නිසා මිනිස්සු ඉදිරියේ හෑල්ලුවීම ඔවුන්ට ආදරය කරපු සැබෑ සිනමා රසිකයන්ගේ හිතේ අමාරුවට හේතුවක්. ඒ නිසා මේ යථාර්තය ඒ අයට පෙන්නලා දෙන්නම ඕන. හිතවත්කම් කඩාගන්න බැරිකමට කරන ඕනම වැඩක් 'මාරයි' කියලා ඒ මිනිස්සු ගගේ යවන්නේ නැතුව තිත්ත වුනත් ඇත්ත කියලා ඒ අප රීළගට වැටෙන්න යන වළෙන් හරි ගොඩ ගන්න එක සැබෑ විචාරකයන්නේ සහ රසිකයින්ගේ යුතුකමක් කියලා අපි හිතනවා.

පතිරාජ 'සක්කාරං' චිත්‍රපටියේදී පෙන්නන උදාසීනකමට අපෙන් සමාවක් ලැබෙන්නේ නැහැ. ලංකාවේ නොම්බර එකේ සිනමා කැමරාකරුවකු වන ඩොනල්ඩ් කරුණාරත්න ළඟින් තියාගෙනත් පතිරාජ මේ චිත්‍රපටයේදී පෙන්නන කුසීතකම ගැන අපට හරිම පුදුමයි.

ප්‍රවීණත්වයට පත්වෙන්න වෙන්නම නිර්මාණාත්මකව බංකොලොත් වීමේ අභාග්‍යයට මුහුණ දුන්නේ පතිරාජ විතරක් නොවෙයි. ලෙස්ටර් පීරිස් පවා මේ ඛේදවාචකයට ගොදුරු වුනා. 'ගම්පෙරළිය, නිධානය' වගේ චිත්‍රපට හදපු ලෙස්ටර් 'අම්මාවරුනේ' හදලා පෙන්නන කොට ලෙස්ටර් පීරිස්ටත් වඩා කටඋත්තර නැති වුණේ අපිට. මොකද ලෙස්ටර් ගැන අපේ හිත්වල තිබුණු ලොකු රූපය දිය වුණු නිසා. ගාමිණලා එක්ක වැඩකරපු ලෙස්ටර්ට අන්තිම කාලේ වැඩ කරන්න වුණේ රොෂාන් පිලපිටියලා වගේ අය එක්ක නිසා මුලින් හැදුවා වගේ චිත්‍රපට හදන්න බැරි වීම ගැන පුදුම වෙන්න ඕනත් නෑ.

'ගග අද්දර' හදපු සුමිත්‍රා පීරිස් 'යහළුවෝ' චිත්‍රපටය හදලා කරගත්තෙත් මේ ටිකමයි. විජය කුමාරතුංගලා එක්ක චිත්‍රපට හදපු සුමිත්‍රා සුජීව සේනසිංහලා නළුවෝ කරන්න ගියාම මෙහෙම දේවල් වෙනවා. සුමිත්‍රාට හරියට නළුවෙක් කරන්න බැරිවුණු සුජීව සේනසිංහ අද පාර්ලිමේන්තුවේ නම් හොඳට රගපානවා අපට පේනවා. 'පළගැටියෝ, දඩයම' වගේ චිත්‍රපට හදපු වසන්ත ඔබේසේකර පවා අන්තිමට



ඇවිල්ලා නැවතුනේ 'සෙව්වන්දි' ළඟ. මේ ලැයිස්තුව තවත් දිගට ඕන නම් ලියන්න පුළුවන්. සුමිත්‍රා පීරිස් 'සක්කාරං' චිත්‍රපටය ගැන කියපු කතාවක් ඒ චිත්‍රපටයේ ප්‍රචාරක දැන්වීමක තිබුණා. සුමිත්‍රා කියන්නේ 'සක්කාරං' පතිරාජ හදපු හොඳම චිත්‍රපටය කියලා. ඒකෙන් හිතාගන්න පුලුවන් සුමිත්‍රාලා සිනමාව ගැන අද හිතන හැටි. හිතවත්කමට වුණත් මිනිස්සු එහෙම බොරුවට පුම්බලා උඩ අරින්න හොඳ නෑ.

අපි මේ කියන දේවල් වලින් මේ ප්‍රවීණ කලාකරුවෝ ලේ කෝප කර නොගනීවි කියලා අපි හිතනවා. කවුරු කොයි විදියට චිත්‍රපට හැදුවත් ඒ අයට ගනුදෙනුව අවසන් කරන්න වෙන්නේ ප්‍රේක්ෂකයොත් එක්ක. ඒ ගණුදෙනුවේදී ප්‍රේක්ෂකයන් අතින් මේ ප්‍රවීණයෝ ප්‍රතික්ෂේප වෙලා මේ අයගේ චිත්‍රපටි සුමානෙන් දෙකෙන් චිත්‍රපටි හෝල්වලින් ගැලවිලා යන එක ඒ ප්‍රවීණයන්ගේ නමටත් එච්චර හොඳ මදි.

රට රටවල්වල ගිහින් සිනමාව ඉගෙන ගෙන ආව කියලා කයිවාරු ගහන බූඩි කීර්තිසේනලා පවා ලංකාවට ඇවිත් හදන්නේ 'මාතා' වගේ ගෝතකරුම නිසා සිනමාවේ තරුණ පරපුර ගැනත් බය හිතෙනවා. ඒත් පහුගිය කාලයේ නරඹන්න ලැබුණු තරුණ සිනමාකරුවන්ගේ චිත්‍රපට කිහිපයක් නිසා අපිට පොඩි ප්‍රමෝදයක් ලැබුණා. ඒත් මේ තරුණ හාදයෝ තමන්ගේ ඒ චිත්‍රපට පෙන්නගන්න විදියක් නැතුව අමාරුවේ වැටිලා ඉන්නේ.

'සක්කාරං' ගැන විචාරයක් ලියපු එක මෑන් කෙනෙක් යෝජනා කරලා තිබුණා කොච්චර අඩුපාඩු තිබුණත් නිෂ්පාදකයා බේරගන්න ඕන නිසා හැමෝම මේ චිත්‍රපටය බැලුව නම් හොඳයි කියලා. ඒ කතාව නම් මහ ගොබ්බ කතාවක් විදිහටයි මට පේන්නේ. එහෙම නම් ප්‍රේක්ෂකයන්ට කරන්න තියෙන්නේ ටිකට් එකට යන ගාන නුගේගොඩට ගිහිල්ලා එච්.ඩී.ප්‍රේමසිරිගේ අතට දීලා එන එක. එතකොට වැඩේ ඉවරයිනේ. නිශ්පාදකවරු චිත්‍රපටයකට සල්ලි වියදම් කරන්න ඕන හොඳට හොයලා බලලා හොඳම චිත්‍රපටයක් වෙනුවෙන්. එහෙම වුණොත් ප්‍රේක්ෂකයන්ට නිශ්පාදකයා වියදම් කරපු මුදල ගැන වද වෙන්න දෙයක් නැහැ.

අවසාන කාලයේ බාල වැඩ කරන්න ගිහිල්ලා නම සවුත්තු කරගත්තේ නැති කෙනෙක් තමයි ඩී.බී.නිහාල්සිංහ. නිහාල්සිංහගෙන් ගොඩාක් දෙනා 'වැලිකතර' වගේ අලුත් චිත්‍රපටයක් හදන්නේ නැද්ද කියලා ඇහුවම ඔහු නිතරම කියලා තියෙන්නේ 'එහෙම වුණොත් වැලිකතර අගය කළා වගේ අලුත් චිත්‍රපටයත් අගය කරයිද දන්නෑ' කියලා. නිහාල්සිංහ තමන් ගැන නිවැරදි තක්සේරුවක හිටියා කියලා පේනවා.

මේක සිනමා විචාරයක්ම කියලා කවුරුත් හිතන්න ඕන නැහැ. මේක පොඩි අදහස් දැක්වීමක් විතරයි. ලොවෙත් නැතා සයිස් එකේ පට්ට වැඩ කරපු පට්ට පොරවල් අන්තිමට හීනෙන් ඇවිදිනවා වගේ වැඩ කරලා සවුත්තු වුණේ එක ක්ෂේත්‍රයක දෙකක නෙවෙයි. ගොඩක් ක්ෂේත්‍රවලට මේ කාරණය අදාළයි. 'සක්කාරං' එක්ක ලියපු මේ ලියවිල්ල හමාර කරන්නේ ඉදිරියේදී හෝ නෝන්ඩි නොවීමට මේ පට්ට පොරවල්වලට නුවණ පහළවේවා කියලා ප්‍රාර්ථනා කරමින්.

ප්‍රියන්ත කොඩිප්පිලි